# නිවේදන අංක:- R/2025/12

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 2 (MT 2-2016) සේවා ගණයේ III ශ්‍රේණිය ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව, උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/03/02/GA/10/SO/CA දරණ 2025.07.25 දිනැති ඉල්ලීම් ලිපියට අනුව, උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු **එකොළහක් (11)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2025 නොවැම්බර් මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.10.03** වේ.

### 01. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

01.1 2016.09.26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාව, එහි සිදුකරන ලද සංශෝධනවලට අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

01.2 මේ සඳහා ලිඛිත පරීක්ෂණය, වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යනාදියෙන් සුදුසුකම් ලබා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව අදාළ තනතුරට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළාත් ක්‍රීඩා නිලධාරි සේවයේ තනතුරේ III ශ්‍රේණියට බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

01.3 මෙම තනතුරට පත්කරනු ලබන නිලධාරීන් පත්වීම් දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

01.4 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

01.5 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

01.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

01.7 විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන පුද්ගලයින්ගේ සම්පූර්ණ එකතුව **එකොළහකි (11)**. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 02. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MT 2-2025** වැටුප් කේතය අනුව ක්‍රීඩා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.50,630 - 10 X 630/= - 11 X 670/= - 10 X 1,010/= - 10 X 1,190/= - 86,300/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 03. සාමාන්‍ය සුදුසුකම්

03.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

03.2 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචි වී සිටිය යුතුය.

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, අවම වශයෙන් උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි වී සිටිය යුතුය.
**(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

03.3 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

03.4 අයදුම්කරු මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

03.5 අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

03.6 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 35** ට නොවැඩි විය යුතුය.

## 04. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

### (04.01) අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්

**පහත (අ) හෝ (ආ) යන වගන්ති දෙකෙන් කුමන හෝ එකක් සම්පූර්ණ කළ යුතුය.**
**(අ)**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

**සහ**

02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් **එක වරක දී ප්‍රධාන විෂයයන් තුන (03)** සමත්ව තිබිය යුතුය. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**සහ**

03. උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පළාත් ක්‍රීඩා උළෙලේ කේවල තරඟයක හෝ කණ්ඩායම් තරඟයක 1 වන හෝ 2 වන ස්ථාන සඳහා සහතිකපත් ලබා තිබිය යුතුය. එසේ නැතහොත් ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී කේවල තරඟයක හෝ කණ්ඩායම් තරඟයක උතුරු පළාත් නියෝජනය කරමින් 1 වන හෝ 2 වන ස්ථාන හෝ 3 වන ස්ථාන සඳහා සහතික ලබා තිබිය යුතුය.

**නැතහොත්**

**(ආ)**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

**සහ**

02. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ, ලෝක ශූරතා තරඟ හෝ ඔලිම්පික් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර 1 වන හෝ 2 වන හෝ 3 වන ස්ථාන ලබා තිබිය යුතුය.

## 05. බඳවා ගැනීමේ පරිපාටිය

05.1 ලිඛිත පරීක්ෂණය, වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යනාදියේ කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, සේවා ව්‍යවස්ථාව, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

05.2 මෙම බඳවා ගැනීම සඳහා ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීම සඳහා ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු සියයට හතළිහක්වත් **40%** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂකයන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා ඇතුළත් වේ.

05.3 05.1 සහ 05.2 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද පමණක් කුසලතා මැනබලන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පළාත් ක්‍රීඩා නිලධාරී සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

## 06. විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ගෙවා, අදාළ ලදුපත

අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළපෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 07. අයදුම්කිරීමේ පිළිවෙල

07.1 මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2 ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/204"** යනුවෙන් සඳහන් කළ යුතුය.

07.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

07.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

07.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපෑල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

08.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

08.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට, වෘත්තීය පරීක්ෂණයට සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ අදාළ පරීක්ෂණ පැවැත්වෙන විට හෝ ඉන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

### 01. <u>ලිඛිත පරීක්ෂණය</u>

මෙම ලිඛිත පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍රයෙන් සමන්විත වේ. මෙම විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරුවෙකු තමන්ට අදාළ භාෂා මාධ්‍ය තෝරා ගත යුතු අතර, විභාගයට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට එම භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01 | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ ක්‍රීඩා පිළිබඳ දැනුම, මූලික නීති රීති, ක්‍රීඩා පිළිබඳ තාක්ෂණික කරුණු, ශාරීරික යෝග්‍යතාව / | පැය 01 ½ | 100 |

| | | | |
|---|---|---|---|
| | පෝෂණය, ක්‍රීඩාව හා සම්බන්ධ ශාරීරික අවයව සහ ඒවායේ ක්‍රියාකාරීත්වය, ප්‍රථමාධාර, සන්නිවේදන කුසලතාව, ක්‍රීඩා සංවර්ධන උපායමාර්ග, පළාත් මට්ටමේ ජනප්‍රිය ක්‍රීඩාවන් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. **(කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50කින් සමන්විතය.)** | | |

**සටහන:-**

වෘත්තීය පරීක්ෂණයෙන් (යෝග්‍යතාව පරීක්ෂා කිරීම) සමත්වීම සඳහා ලිඛිත පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු **40%** ක් ලබාගත යුතුය.

## 02. වෘත්තීය පරීක්ෂණය

ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයෙන් (ප්‍රායෝගික පරීක්ෂණයෙන්) සමත් විය යුතුය. එම ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පහත සඳහන් කරුණු වලින් සමන්විත වේ.

| අනු අංකය | විෂයය |
|---|---|
| 01 | ප්‍රතික්‍රියා වේගය මැනීම |
| 02 | නම්‍යතාවය මැනීම |
| 03 | උදරයේ මාංශ පේශිවල ශක්තිය මැනීම |
| 04 | බාහු ශක්තිය මැනීම |
| 05 | ශරීර ශක්තිය මැනීම |
| 06 | වේගය මැනීම |
| 07 | දරාගැනීමේ හැකියාව මැනීම |

## 03. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් පහත සඳහන් කරුණුවලට අදාළව ලකුණු ලබාදෙනු ලැබේ.
**(මුළු ලකුණු 100)**

| අනු අංකය | ලකුණු ලබාදෙන විෂයය පරාසය | ලකුණු ලබාදෙන ආකාරය | උප කොටස්වල උපරිම ලකුණු | උපරිම ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | | | |
| 1.1 | ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන ලද ක්‍රීඩා ක්ෂේත්‍රය හා සම්බන්ධ උපාධි සහතිකය | 10 | 10 | **ලකුණු 10** |
| 1.2 | **ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් පාඨමාලා** | | | |
| | වසර 01 හෝ ඊට වැඩි අධ්‍යයන කාලයකින් සමන්විත පාඨමාලා | 05 | 05 | |

<table>
<tr><td></td><td colspan="2">මාස 06 හෝ ඊට වැඩි අධ්‍යයන කාලයකින් සමන්විත පාඨමාලා</td><td>03</td><td></td><td></td></tr>
<tr><td colspan="6">02. අතිරේක වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා</td></tr>
<tr><td>2.1</td><td colspan="2">පුහුණුකරු බලපත්‍රයක් ලබාතිබීම</td><td></td><td>03</td><td rowspan="6">ලකුණු 10</td></tr>
<tr><td>2.2</td><td colspan="2">මැදිහත්කරු / විනිසුරු / තාක්ෂණික නිලධාරී යන ක්‍රීඩා තරඟවල රාජකාරි සඳහා අදාළ පිළිගත් ආයතනයකින් බලපත්‍රයක් ලබා තිබීම.</td><td></td><td>03</td></tr>
<tr><td rowspan="4">2.3</td><td colspan="3">ජාත්‍යන්තර, දේශීය, පළාත් මට්ටමේ විවෘත තරඟවල හෝ ජාත්‍යන්තර, දේශීය ක්‍රීඩා සංගම් විසින් පවත්වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ මළල ක්‍රීඩා තරඟවල මැදිහත්කරු/විනිසුරු/තාක්ෂණික නිලධාරී ලෙස කටයුතු කර තිබීම.</td><td rowspan="4">08</td></tr>
<tr><td colspan="2">01. ජාත්‍යන්තර මට්ටමේ තරඟ (විවෘත / ජාත්‍යන්තර සංගම්)</td><td>තරඟයකට ලකුණු 04</td></tr>
<tr><td colspan="2">02. ජාතික මට්ටමේ තරඟ (විවෘත)</td><td>තරඟයකට ලකුණු 03</td></tr>
<tr><td colspan="2">03. පළාත් මට්ටමේ තරඟ (විවෘත)</td><td>තරඟයකට ලකුණු 03</td></tr>
</table>

<table>
<tr><td colspan="7">03. ක්‍රීඩා දක්ෂතා</td></tr>
<tr><td rowspan="6">3.1</td><td colspan="4">ජාත්‍යන්තර මට්ටමේ තරඟයක (ආසියානු / පොදු රාජ්‍ය මණ්ඩලීය / ලෝක ශූරතා / ඔලිම්පික් ) ජයග්‍රහණ ලබා තිබේනම් පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.</td><td rowspan="6">75</td><td rowspan="12">ලකුණු 75</td></tr>
<tr><td rowspan="2"></td><td colspan="3">ලකුණු ලබාදෙන ආකාරය</td></tr>
<tr><td>රන්</td><td>රිදී</td><td>ලෝකඩ</td></tr>
<tr><td>1. කේවල තරඟ (Individual / Single )</td><td>75</td><td>70</td><td>65</td></tr>
<tr><td>2. යුගල / මිශ්‍ර යුගල තරඟ (Double / Double Mix)</td><td>65</td><td>60</td><td>55</td></tr>
<tr><td>3. කණ්ඩායම් තරඟ (Team)</td><td>55</td><td>50</td><td>45</td></tr>
<tr><td rowspan="6">3.2</td><td colspan="4">ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලක දී ජයග්‍රහණ ලබා තිබීම.</td><td></td></tr>
<tr><td rowspan="2"></td><td colspan="3">ලකුණු ලබාදෙන ආකාරය</td><td rowspan="5">30</td></tr>
<tr><td>රන්</td><td>රිදී</td><td>ලෝකඩ</td></tr>
<tr><td>1. කේවල තරඟ</td><td>35</td><td>30</td><td>25</td></tr>
<tr><td>2. යුගල තරඟ</td><td>30</td><td>25</td><td>20</td></tr>
<tr><td>3. කණ්ඩායම් තරඟ</td><td>25</td><td>20</td><td>15</td></tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3.3 | **පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා උළෙලක දී ජයග්‍රහණ ලබා තිබීම.** | | | | **20** | |
| | | **ලකුණු ලබාදෙන ආකාරය** | | | | |
| | | **රන්** | **රිදී** | **ලෝකඩ** | | |
| | 1. කේවල තරඟ (Individual / Single ) | 15 | 12.5 | 10 | | |
| | 2. යුගල / මිශ්‍ර යුගල තරඟ (Double / Double Mix) | 12.5 | 10 | 7.5 | | |
| | 3. කණ්ඩායම් තරඟ (Team) | 7.5 | 05 | 2.5 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.4 | **ජාතික / පළාත් මට්ටමේ (විවෘත) තරඟයකින් ජයග්‍රහණය කළ ක්‍රීඩකයන්ගේ (පහත සඳහන් අංශවල) ප්‍රාදේශීය මට්ටමේ / පෞද්ගලික පුහුණුකරුවෙකු වීම.** | | | **10** | |
| | | **එක් ක්‍රීඩකයෙකු වෙනුවෙන් ලබාදෙන ලකුණු ප්‍රමාණය** | **එක් එක් අංශවල සළකා බැලෙන ක්‍රීඩකයන්ගේ උපරිම සංඛ්‍යාව** | | |
| | 1. කේවල තරඟ (Individual / Single ) | 02 | 05 | | |
| | 2. යුගල / මිශ්‍ර යුගල තරඟ (Double / Double Mix) | 01 | 10 | | |
| | 3. කණ්ඩායම් තරඟ (Team) | 0.5 | 20 | | |
| **04.** | **සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රදර්ශනය කරන කුසලතා** | | | | |
| | සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රදර්ශනය කරන පෞරුෂය, සන්නිවේදන කුසලතා, නායකත්ව ගුණාංග | | | **05** | **ලකුණු 05** |
| | **එකතුව** | | | | **ලකුණු 100** |

**<u>සටහන:-</u>**

**ඉහත 3.1 සහ 3.2 යන කිසියම් හෝ තරඟයක ලබාගත් ඉහළ කාර්ය සාධන මට්ටමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.**

## 12. විභාග ප්‍රතිඵල

විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk → **Exams & Recruitments** → **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**<u>සැළකිය යුතුය</u>**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.09.15**